# වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පියවර II අදියර 2

# ඇබෑර්තු (කොන්ත්‍රාත් පදනම)

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය යනු ගුවන් සේවා කර්මාන්තයේ වර්ධනය වන ඉල්ලුම් සපුරාලීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පහසුකම් පරිවර්තනය කිරීම සහ පුළුල් කිරීම අරමුණු කරගත් සන්ධිස්ථානීය මුල පිරීමකි. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (JICA) මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයන අතර එයට අති නවීන උපකරණ වලින් සමන්විත නවීන පහසුකම් සහිත නව්‍ය පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය සඳහා පර්යන්තය පමණක් නොව ජපන් ඉංජිනේරු උපදේශනය සමග යාන්ත්‍රික, විදුලි සහ ජලනල (MEP) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් ඇතුළු ආශ්‍රිත කාර්යයන්හි සමස්ත ක්‍රියාවලියම ඇතුළත් වේ.

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 අනුව කටුනායක, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම් ලත් ක්‍රියාශීලී ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ව්‍යාපෘති අධ්‍යක්ෂ - තනතුරු 01

**ප්‍රධාන වගකීම් :**

සම්පූර්ණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ සමස්ත සැලසුම් නිර්මාණ කරණය, සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කරවීම, ඉදිකිරීම් අධීක්ෂණය අතරතුර සමස්ත සම්බන්ධීකරණය, පරීක්ෂා කිරීම, තත්ත්ව පාලනය, ව්‍යාපෘතියෙහි සියලුම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ වාර්තා කිරීම ඇතුළුව ඵලදායී ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වගකිව යුතුය.

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය

සහ

පිළිගත් ඉංජිනේරු ආයතනයනක සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ වලංගු සාමාජිකත්වය.

සමග

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 07 ක් ඇතුළත්ව කළමනාකරණ මට්ටමේ වසර අවම 14 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

බහුජාතික පරිසරයක් තුළ (විශේෂයෙන් විදේශ අරමුදල් සහිත) සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති සහ / හෝ බහු විෂයික ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණය කිරීමේ පුළුල්, වසර ගණනක පළපුරුද්ද ඇති සහ කොන්ත්‍රාත් පරිපාලනය සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ.

**වැටුප :** PS1 මට්ටම රු. 200,000/- + රජයේ අනුමත දීමනා

### 02. ප්‍රධාන ඉංජිනේරු - තනතුරු 02

**සුදුසුකම් (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

හෝ

ii. අදාළ ක්ෂේත්‍රයේ රජයේ දීප ව්‍යාප්ත සේවයේ III/II ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ සමාන තත්ත්වක් ලබා තිබීම.

සමග

සුදුසුකම් ලැබීමෙන් අනතුරුව III/II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 9 ක පළපුරුද්ද

**වැටුප :** PS4 මට්ටම - රු. 155,000/- + රජයේ අනුමත දීමනා

### 03. ප්‍රධාන ප්‍රමාණ සමීක්ෂක - තනතුරු - 01

**සුදුසුකම්**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක්

සමග

ii. ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සමග

ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සාමාජිකත්වය

සමග

ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**වැටුප :** PS4 - රු. 155,000/- + රජයේ අනුමත දීමනා

### 04. ව්‍යාපෘති ලේකම් - තනතුරු 01

**සුදුසුකම් (පහත i හෝ ii)**

i. ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ භාෂා ඇතුළුව විෂයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙ) විභාගය විෂයන් හයකින් (06) සමත්වී තිබීම

සමග

පිළිගත් ආයතනයකින් ලේකම් පාඨමාලාවක් හදාරා තිබීම හෝ වරලත් ලේකම් තනතුර සඳහා විභාග හදාරමින් සිටීම

සමග

ලේකම් තනතුරක අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද

හෝ

ii. වරලත් ලේකම් සුදුසුකම් සමග ලේකම් තනතුරක අවම වසර 05 ක පළපුරුද්ද.

**වැටුප :** PS6 මට්ටම - රු. 67,000 + රජයේ අනුමත දීමනා

### 05. කාර්යාල සහායක - තනතුරු 02

**සුදුසුකම් (පහත i හෝ ii)**

i. වාර දෙකකට නොවැඩි ගණනකදී සිංහල / දෙමළ ඇතුළුව විෂයක් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙ) විභාගය විෂයන් හයකින් (06) සමත් වී තිබීම.

ii. පරිගණක දැනුම සහ කාර්යාල සහායක පළපුරුද්ද අතිරේක සුදුසුකම් වේ.

iii. ගම්පහ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

**වැටුප :** මුදල් අමාත්‍යාංශයේ 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව වේ.

### 06. රියදුරු - තනතුරු 03

**සුදුසුකම් (පහත i හෝ ii)**

i. වාර දෙකකට (02) නොවැඩි ගණනකදී සිංහල / දෙමළ ඇතුළුව විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයන් හයකින් සමත් වී තිබීම.

**වෘත්තීය සුදුසුකම්**

i. 24 CWT ට අඩු තාර බරක් සහිත පුද්ගලික / කුලියට ගත් වාහන සහ ස්ටේෂන් වැගන් පැදවීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය. (නව රියදුරු බලපත්‍ර යෝජනා ක්‍රමය අනුව බඳවා ගනු ලබන දින සිට වසර තුනකට (03) පෙර අවම වශයෙන් C හෝ C1 පන්තියේ හෝ B පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් ලබාගෙන තිබිය යුතුය)

**පළපුරුද්ද**

රියදුරෙකු ලෙස වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද සනාථ කිරීම සඳහා ලේඛන සහතික ඉදිරිපත් කළ යුතුය)

**ශාරීරික සුදුසුකම් / යෝග්‍යතාවය**

i. උස අවම වශයෙන් අඩි 05 ක් (05' 0") විය යුතුය.

ii. දිවා රාත්‍රී දෙකෙහිම සේවය කිරීම සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු අතර, පෙනීම හොඳ තත්ත්වයේ තිබිය යුතු අතර එය රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද නිල සහතිකයක් මගින් සනාථ කළ යුතුය.

iii. ගම්පහ දිස්ත්‍රික්කය තුළ පදිංචි කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

iv. අයදුම්කරු තෝරා ගැනීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

**වැටුප :** මුදල් අමාත්‍යාංශයේ 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව වේ.

**වයස :** තනතුරු අංක 1, 2 සහ 3 සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 64 ට නොවැඩි විය යුතුය.

තනතුරු අංක 4, 5 සහ 6 සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**පොදු කොන්දේසි :**

සේවකයින් EPF (සේවක අර්ථ සාධක අරමුදල) සඳහා වැටුපෙන් 8% ක දායකත්වයක් දැරිය යුතු අතර, සේවා යෝජකයා විසින් EPF (සේවක අර්ථසාධක අරමුදල) සඳහා වැටුපෙන් 12% ක් සහ ETF (සේවක භාරකාර අරමුදල) සඳහා වැටුපෙන් 3% ක දායකත්වයක් දරනු ලැබේ.

**සේවා නියුක්තියේ නියමයන් :**

එක් වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගනු ලබන අතර කාර්ය සාධනයේ සතුටුදායක බව සහ ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත වාර්ෂිකව දීර්ඝ කරනු ලැබේ.

**සේවය කළ යුතු ස්ථානය :**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, පියවර II අදියර 2,**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**මීනුවන්ගොඩ පාර, නයිකන්ද, කටුනායක.**

**අයදුම්පත් :**

ජීව දත්ත තොරතුරු සහ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් තොරතුරු සමග 2025 නොවැම්බර් 17 වන දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලේකම්, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, 25 වන මහල, බටහිර කුලුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. සහතික පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.

දැනට රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා එවිය යුතුය.

සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවේ.

**ලේකම්,**
**වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,**
**25 වන මහල, බටහිර කුලුන,**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ - 01.**